## කුඩා අන්ත්‍රයේ දී සිදු වන අවශෝෂණය

- ඵලදායි අවශෝෂණය සඳහා, ආන්ත්‍රික බිත්තියේ පෘෂ්ඨ ක්ෂේත්‍රඵලය ව්‍යුහමය විකරණයන් තුනක් මඟින් වැඩි කර ගෙන ඇත.
- ඒවා නම් ඝන ස්ථිර නැමුම්
- අංගුලිකා නම් ආන්ත්‍රික බිත්තියේ ඇති ඇඟිලි බඳු නෙරුම්
- ක්ෂුද්‍ර අංගුලිකා නම් අංගුලිකාවල අපිච්ඡද සෛලවල ඇති ඇඟිලි වැනි අන්වීක්ෂීය නෙරුම්. (මේ ක්ෂුද්‍ර අංගුලිකා ආන්ත්‍රික කුහරයට නිරාවරණයවී පවතී. මෙමඟින් බුරුසුමය පෙනුමක් ලබා දෙයි. (බුරුසු දාරය).)

  - අපිච්ඡදය හරහා පෝෂක පරිවහනය සක්‍රිය හෝ අක්‍රිය විය හැකි ය. උදාහරණයක් ලෙස ෆ්‍රක්ටෝස් පහසු කළ විසරණය (facilitated diffusion) මඟින් අවශෝෂණය වේ. සිදු වේ. ඇමයිනෝ අම්ල, කුඩා පෙප්ටයිඩ, විටමින් සහ බොහෝ ග්ලූකෝස් අණු අපිච්ඡේද සෛල තුළට සක්‍රිය ව පරිවහනය කෙරේ.
  - ඉන් පසු මේ පෝෂක අපිච්ඡද සෛලවල සිට අංගුලිකා තුළ ඇති රුධිර කේශනාලිකාවලට පරිවහනය කෙරේ. මේ රුධිර කේශනාලිකා යාකෘතික ප්‍රතිහාර ශිරාව සෑදීමට අභිසාරී වී එකට එකතු වේ. මේ පෝෂක යාකෘතික ප්‍රතිහාර ශිරාව ඔස්සේ අක්මාවට රැගෙන යයි. අක්මාවේ සිට මේ පෝෂක පිරි රුධිරය පටකවලට පරිවහනය කරයි.
  - එහෙත් මේද ජීරණයේ සමහර ඵල අවශෝෂණය වෙනස් මාර්ගයක් ඔස්සේ සිදු වේ. මේද අම්ල හා මොනොග්ලිසරයිඩ ක්ෂුද්‍ර අංගුලිකා හරහා සෛලය තුළට ඇතුළු වේ. සෛල තුළ දී ට්‍රයිග්ලිසංරයිඩ නැවත ඇති වේ. ඉන් පසු මේ ට්‍රයිග්ලිසරයිඩ, කයිලොමයික්‍රෝන නම් වූ ජලයේ ද්‍රාව්‍ය කුඩා ගෝලිකා තුළට අන්තර්ගත වේ. ඉන් පසු මේ කයිලොමයික්‍රෝන පයෝලස නාලිකාවට පරිවහනය කෙරේ. ඉන් පසු පයෝලස නාලිකාවේ සිට වසා හරහා රුධිර වාහිනීවලට ඇතුළු වේ. ඉන් පසු මේ කයිලොමයික්‍රෝන සංසරණ පද්ධතිය ඔස්සේ දේහය පුරා සංසරණය වේ.
  - පෝෂක අවශෝෂණයට අමතර ව, ජලය හා අයන නැවත ලබා ගැනීම කුඩා අන්ත්‍රයේ දී සිදු වේ. සිරුරට ලබා ගන්නා ජලය ප්‍රමාණයට (2L) අමතර ව, ජීරණ යුෂයෙන් තවත් ජලය (7L) කුඩා අන්ත්‍රයට එකතු කෙරේ.මේ ජලයෙන් වැඩි කොටසක් ආස්‍රැතිය මඟින් නැවත අවශෝෂණය සිදු කෙරේ.

### ක්ෂුද්‍රාන්ත්‍රයේ කාර්යයන්

1. ආහාර රසායනික ජීරණයකට ලක් කිරීම.
2. ජීරණය වූ ආහාර අවශෝෂණය
3. ආමාශයේ දී විනාශ නොවූ ක්ෂුද්‍ර ජීවීන් ජීවීන් විනාශ කිරීම.
4. හෝමෝන ස්‍රාවය කිරීම.
5. ක්ෂුද්‍රාන්ත්‍රයේ සිදුවන ක්‍රමාකුංචන තරංග ආහාර පරිවහනය කිරීමට උපකාරි වේ.

## ➲ මහා අන්ත්‍රය

- ආහාර මාර්ගයේ අවසාන කොටස මහා අන්තයයි.
- උදර කුහරය තුළ පිහිටන මෙය සාමාන්‍යයෙන් මීටර 1.5 ක් පමණ දිගකින් යුක්ත වේ.
- මහාන්ත්‍රය, උණ්ඩිකයෙන් ආරම්භ වී දඟර ගැසුණු ක්ෂුද්‍රාන්ත්‍රය වටා වක්‍රාකාර ලෙස ගමන් කර ගුදයෙන් කෙළවර වේ.
- එය ප්‍රදේශ තුනකට බෙදිය හැකි ය. ඒවා නම්,

    1. ........................................... (Colon) - අවිදුර කොටස
    2. ........................................... (Cecum)
    3. ...........................................

- කුඩා අන්ත්‍රය මහාන්ත්‍රයට ''T'' හැඩැති සන්ධියකින් සම්බන්ධ වේ.
- මේ ''T'' සන්ධියේ එක් බාහුවක් මහාන්ත්‍රකය වන අතර, අනෙක් බාහුව කුඩා පැසක් වැනි උණ්ඩුකය වේ.

### 01. උණ්ඩුකය

- මහාන්ත්‍රයේ මුල් ම කොටස වන්නේ උණ්ඩුකයයි.
- මෙය කුඩා පැසක(මඩියක) ස්වරූපයක් ගනී.
- ශේෂාන්ත්‍රික - උණ්ඩුක කපාටය මගින් එය ක්ෂුද්‍රාන්ත්‍රය සමග සම්බන්ධ වේ.
- උණ්ඩුකයේ උණ්ඩුකපුච්ඡය නම් වූ ඇඟිල්ලක් වැනි නෙරුමක් ඇත. මෙය විදුර කෙළවර සංවෘත වූ කුඩා නාළයකි.
- ජීරණය නොවූ ද්‍රව්‍ය ක්ෂුද්‍රජීවීන් මඟින් පැසීම සඳහා උණ්ඩුකය වැදගත් වේ. විශේෂයෙන් විශාල වශයෙන් ශාක ද්‍රව්‍ය ආහාරයට ගන්නා සත්ත්වයන්ගේ ය.

### 02. මහාන්ත්‍රකය

- මහාන්ත්‍රයේ දෙවන කොටස් වන මහාන්ත්‍රකය දිගු නාලයකි. එහි කොටස් කිහිපයකි.

    1. ආරෝහණ මහාන්ත්‍රකය - උදර කුහරයේ දකුණු පැත්ත ඔස්සේ අක්මාවේ පහළ පෘෂ්ඨය දක්වා ගමන් කරයි.
    2. තීර්යක් මහාන්ත්‍රකය - ආමාශය හා ග්‍රහණියට ඉදිරියෙන් තිරස් ලෙස ගමන් කරයි.
    3. අවරෝහණ මහාන්ත්‍රකය - උදර කුහරයේ වම් පැත්ත ඔස්සේ පහළට ගමන් කරයි.
    4. සිග්මාකාර මහාන්ත්‍රකය - මධ්‍ය රේඛාව වෙත දිවෙන කොටසයි.

- මහාන්ත්‍රකය ගුද මාර්ගයට හා ගුදයට යොමු වේ.

### 03. ගුද මාර්ගය

- මහාන්ත්‍රයේ විදුර කොටස වන ගුද මාර්ගය තරමක් පළල් කොටසකි. එහි කෙළවර පිහිටි විවරය ගුදයයි.
- ආහාර මාර්ගයේ දර්ශීය සැලැස්මේ දක්නට ලැබෙන පටක ස්තර සියල්ල ම මහාන්ත්‍රයේ ද පිහිටයි.

### මහාන්ත්‍ර බිත්තියේ විශේෂ ලක්ෂණ

- මහාන්ත්‍රයේ ශ්ලේෂමලකයේ අංගුලිකා හෝ සථිර වෘත්තාකාර නැමුම් හේ නොපිහිටයි.
- මහාන්ත්‍රයේ ශ්ලේෂ්මලකය ආස්තරයේ ශ්ලේෂමල ග්‍රන්ථි බහුල ව පිහිටයි.
- ආහාර මාර්ගයේ අනෙක් ප්‍රදේශවලට වඩා හොඳින් මහාන්ත්‍රයේ අධඃශ්ලේෂ්මලකයේ වසා ගැටිති විකසනය වී ඇත.
- ගුද මාර්ගය හැර මහාන්ත්‍රයේ අනික් කොටස්වල පේශි චෝලයේ අන්වායාම පේශි ස්තරයක් නොපිහිටයි. අන්වායාම පේශි පටි 3 ක් පිහිටයි. ඒවා කෝලි පටි නම් වේ.




### මහා අන්ත්‍රයේ කෘත්‍ය

**1. මහාන්ත්‍රකය**

- ජලය ප්‍රතිඅවශෝෂණය සම්පූර්ණ කරයි.
- ක්ෂුද්‍ර ජීවීන් ආධාරයෙන් සමහර විටමින් B සංකීර්ණ, විටමින් K සහ ෆෝලික් අම්ල සංශ්ලේෂණය
- මල (තන්තු වැනි ජීරණය නොවූ ද්‍රව්‍ය අඩංගුවේ) ක්‍රමාකුංචනය මඟින් මහාන්ත්‍රකය තුළින් ගමන් කිරීම.

**2. ගුදමාර්ගය**

- බැහැර කරන තෙක් මල ගබඩා කරයි.
- ගුද මාර්ගය හා ගුදය අතර, පවතින වක්‍රපිධාන දෙක හේතුවෙන් මල ගමන් කිරීම යාමනය කරයි. මහාන්ත්‍රය තුළ ප්‍රබල සංකෝචනයන් මල පහ කිරීම ක්‍රියාරම්භ කරයි.

# <u>ආශ්‍රිත ග්‍රන්ථි</u>

## ➲ <u>අග්න්‍යාශය</u>




ග්‍රහණිය හා පිත්ත ප්‍රණාලයට සාපේක්ෂව අග්න්‍යාසය

<u>අග්න්‍යාශයේ පටකීය ව්‍යූහය</u>

- ආමාශයට පහතින් ග්‍රහණි නැම්මේ පිහිටයි.
- අග්න්‍යාශය ළා අළු පැහැති පැතැළි ග්‍රන්ථියකි.
- බාහිරාසර්ග හා අන්තරාසර්ග ග්‍රන්ථියකි.
- එය පළල් හිසක්, දේහය සහ පටු වලිගයකින් සමන්විත ය.




- අග්න්‍යාශයේ පළල්ම ප්‍රදේශය වන්නේ හිස යි. හිස ග්‍රහනි වක්‍රය තුළ පිහිටා ඇත.
- මැද ප්‍රදේශය දේහය වන අතර එය ආමාශයට අපර ව පිහිටයි. ක්‍රමයෙන් පටු වන වලිගය ප්ලීහාව ආසන්නයේ පවතී.

- ග්‍රහණියේ මධ්‍ය ප්‍රදේශයට අග්න්‍යාශයික ප්‍රනාලය හා පොදු පිත්ත ප්‍රනාලය විවෘත වේ.
- අග්න්‍යාශය හරහා අග්න්‍යාශයික ප්‍රනාලය ගමන් කරයි. එය ග්‍රහණියේ මැද ප්‍රදේශයට විවෘත වේ.
- අග්න්‍යාශය තුළ ප්‍රධාන කොටස් දෙකකි.
  1. …………………………………………………………..
  2. …………………………………………………………..

### 1. අන්තරාසර්ගී කොටස

- අග්න්‍යාසයේ අන්තරාසර්ගී කොටස සමන්විත වන්නේ ලැන්ගහැන් දීපිකා වන අතර, එය විශේෂණය වූ සෛල සමූහයකින් යුක්ත වේ. ඒවාට ප්‍රනාල නැත.
- ලැන්ගහැන් දීපිකා යනු, අග්න්‍යාශයේ තැනින් තැන පිහිටා ඇති අක්‍රමවත් සෛල ගොනු වේ.
- මේවායේ පිහිටන සෛල වර්ග 2 කි.

  1. ..........................................................................
  2. ..........................................................................

- ලැන්ගහැන් දීපිකා ග්ලූකගන් හා ඉන්සියුලින් යන හෝමෝන ස්‍රාවය කරයි. ඒවා ග්ලූකෝස් සමස්ථිතිය සඳහා දායක වේ.

### 2. බාහිරාසර්ගී කොටස

- අග්න්‍යාශයේ බාහිරාසර්ගි කොටස අනුඛණ්ඩිකා විශාල සංඛ්‍යාවකින් සමන්විත වේ.
- මේ අනුඛණ්ඩිකා කුඩා බදරිකාවලින් සමන්විත වන අතර, ඒවායේ බිත්තිය ස්‍රාවී සෛලවලින් සමන්විත වේ. බදරිකා යනු අග්න්‍යාශයික යුෂ ස්‍රාවය කරන ග්‍රන්ථිමය ව්‍යුහයන් ය.
- එක් එක් අනුඛණ්ඩිකා ඉතා කුඩා ප්‍රනාලවලට සම්බන්ධ වන අතර, එම ප්‍රනාල එකතු වීමෙන් අවසානයේ දී අග්න්‍යාශයික ප්‍රනාලය සෑදේ.
- මේ අග්න්‍යාශයික ප්‍රනාලය පිත්ත ප්‍රනාලය සමඟ සම්බන්ධ වී, යාකෘත්-අග්න්‍යාශයික ප්‍රනාලය සාදයි. මෙය ග්‍රහනියේ මධ්‍ය ලක්ෂ්‍යයේ දී එය තුළට විවෘත වේ.
- අග්න්‍යාශයේ බහිරාසර්ගි කොටස අග්න්‍යාශයික යුෂය ස්‍රාවය කරයි.

<u>අග්න්‍යාශයික යුෂයේ සංඝටක</u>

1. බයිකාබනේට
2. කාබෝහයිඩ්‍රේට ජීර්ණක එන්සයිම (අග්න්‍යාශයික ඇමයිලේස්)
3. අග්න්‍යාශයික ලයිපේස්
4. නියුක්ලියේස්
5. ප්‍රෝටීන ජීර්ණක එන්සයිමවල අක්‍රිය ආකාර (ට්‍රිප්සිනෝජන් සහ කයිමොට්‍රිප්සිනෝජන්)
6. මේ අක්‍රිය එන්සයිම ග්‍රහනියේ කුහරයට ස්‍රාවය වීමත් සමඟම සක්‍රිය එන්සයිම (ට්‍රිප්සීන් හා කයිමොට්‍රිප්සින්) බවට පරිවර්තනය කෙරේ.

- ක්ෂුද්‍රාන්ත්‍රය තුළ අඩංගු ද්‍රව්‍යයන් හි ආම්ලිකතාව ඉහළ නැංවීම සඳහා අග්න්‍යාශය උපකාරී වේ.




**අග්න්‍යාශයේ පටක විද්‍යාත්මක ව්‍යුහය**

## ➲ පිත්තාශය

- පිත්තාශය පිහිටන්නේ අක්මාවේ අධර පැත්තේ ය.
- පෙයාර්ස් හැඩැති ව්‍යුහයකි.
- පිත අක්මාවේ දී නිපදවේ. පිත්තාශය තුළ ගබඩා වේ.
- කොලොසිස්ටොකයිනින් හෝමෝනයේ බලපෑම මගින් පිත්තාශය සංකෝචනය වී පොදු පිත්ත ප්‍රනාලය ඔස්සේ ග්‍රහණියට පිත ගලා එයි.




**පිතෙහි සංඝටක**

1. ...................................................................................
2. ...................................................................................
3. ...................................................................................
4. ...................................................................................
5. ...................................................................................
6. ...................................................................................
7. ...................................................................................

➢ **පිත් වර්ණක එන්සයිම කිසිවක් නොදරනු ලබයි.**

**පිතෙහි කාර්යයන්**

1. පිත් ලවණ මගින් ක්ෂුද්‍රන්ත්‍රයේ දී මේද තෛලෝදකරණයට ලක් වේ. එනම් මේදය කුඩා ගෝලිකා බවට පත් වේ. එවිට ලයිපේස් එන්සයිමයට මේදය මත පහසුවෙන් ක්‍රියා කළ හැකි වේ.
2. දේහයට මේද අවශෝෂණය කර ගැනීම සඳහා ද ක්ෂුද්‍රාන්ත්‍රයේ පිත තිබීම වැදගත් වේ.
3. පිත මගින් ස්වාරක්ෂක ක්‍රියාවක ද ඉටු කරයි.
4. මළ ද්‍රව්‍ය වර්ණ ගන්වයි.



## ➲ අක්මාව

- අක්මාව වැදගත් කෘත්‍ය රැසක් සිදු කරන ඉතා වැදගත් අවයවයකි.
- අක්මාව මිනිස් සිරුරේ දෙවන විශාල අවයවය වන අතර දේහයේ ඇති විශාලම ග්‍රන්ථිය වේ.
- පිහිටීම.......................................................................................................................
  .......................................................................................................................
  .......................................................................................................................
- එහි උත්තර හා පූර්ව මතුපිට පෘෂ්ඨය සුමට, උත්තල හැඩයක් ගනී. එහි අපර පෘෂ්ඨයේ මායිම අක්‍රමවත් හැඩයක් ගනී.
- අක්මාවේ ඛණ්ඩිකා හතරක් අඩංගු වේ.
  1. ........................................................................
  2. ........................................................................
  3. ........................................................................
  4. ........................................................................

- අක්මාවට රුධිරය සැපයෙන මාර්ග දෙකකි. ඒවා නම්,

  1. ........................................................ - අක්මාව වෙත ඔක්සිජනීකෘත රුධිරය ගෙන එයි. එය අක්මාවේ රුධිර සැපයුමෙන් 20% ක් පමණ වේ.

  2. .......................................................................................... - ආහාර මාර්ගයෙන් අවශෝෂණය කරගත් පෝෂ්‍ය ද්‍රව්‍ය සහිත රුධිර අක්මාව වෙතට ගෙන එයි. එය අක්මාවේ රුධිර සැපයුමෙන් 80 ක් වේ.

- යාකෘතික ශිරාව ඔස්සේ අක්මාවේ සිට ඔක්සිජන් විමුක්ත රුධිරය අධර මහා ශිරාවට ගලා යයි.



- අක්මා ඛණ්ඩිකා සමන්විත වනුයේ ඉතා කුඩා අනුඛණ්ඩිකා රාශියකිනි.
- එම අනුඛණ්ඩිකා,
  - ✓ පියවි ඇසට නොපෙනේ.
  - ✓ ෂඩස්‍රාකාර හැඩයක් ගනී.
  - ✓ ඒවා අක්මාවේ කෘත්‍යමය ඒකකය වේ.
  - ✓ අක්මා අණු ඛණ්ඩිකාවක්ම මැද මධ්‍ය ශිරාව පිහිටයි.
  - ✓ සෑම අනුඛණ්ඩිකාවක්ම සම්බන්ධක පටක වලින් වට වී ඇත.
  - ✓ ෂඩස්‍රාකාර ව්‍යුහවල පර්‍යන්තයේ කොන් වල ග්ලිසන් ප්‍රාචාර ලෙස හැඳින්වෙන ප්‍රදේශ ඇත. මෙම ප්‍රදේශ සම්බන්දක පටක වලින් සමන්විතය.
  - ✓ ග්ලිසන් ප්‍රාවර තුළ යාකෘතික ප්‍රතිහාර ශිරාවේ සහ යාකෘතික ධමනියේ ශාඛාවක්, පිත්ත ප්‍රණාලයේ ශාඛාවක්, අන්තර් අනුඛණ්ඩික පිත්ත ප්‍රනාලයක් (වසා වාහිනිවල ශාඛාවක්) පිහිටයි.
  - ✓ මේ අනුඛණ්ඩිකා ඝනාකාර හැඩැති හෙපැටොසයිට නම් වූ සෛලවලින් සෑදී ඇත. මේවා මධ්‍ය ශිරාවේ සිට අරීය ස්තම්භ යුගල වශයෙන් විහිදී ඇත.
  - ✓ මේ සෛල ස්තම්භ යුගල දෙකක් අතර, කෝටරාභ (Sinusoids) පවතී. අක්මා කෝටරාභ යනු අසම්පූර්ණ බිත්ති සහිත රුධිර වාහිනී) ය.
  - ✓ මෙම කෝටරාභ රුධිරයෙන් පිරී පවති. යාකෘතික ප්‍රතිහාර ශිරාවෙන් හා යාකෘතික ධමනියෙන් හටගන්නා ශාඛා ඔස්සේ රුධිරය කෝටරාභ තුළට ගලා යයි.
  - ✓ එම නිසා ඒවා තුළ ප්‍රතිහාර ශිරාවේ හා යාකෘතික ධමනියේ කුඩා ශාඛාවලින් ලැබෙන රුධිරය මිශ්‍රණයක් අඩංගු වේ.
  - ✓ මේ සැකසීම නිසා පෝෂක ද්‍රව්‍ය අධික සාන්ද්‍රණයකින් පවතින ශිරා රුධිරය සහ ධමනිවල ඇති ඔක්සිජනීකෘත රුධිරය සමඟ මිශ්‍ර වීමෙන් අක්මා සෛලවලට සමීප වීමට ඉඩ සලසා දෙයි.
  - ✓ අක්මා සෛල ස්තම්භ අතර, පිත්ත නාලිකා විහිදේ. පිත්ත නාලිකා එකතු වීමෙන් වඩා විශාල පිත්ත නාල සෑදේ.
  - ✓ කෝටරාභවල සිට මධ්‍ය ශිරාවට රුධිරය ගලා යන අතර, එය වෙනත් අනුඛණ්ඩිකාවලින් පැමිණෙන ශිරා සමඟ සම්බන්ධ වී වඩා විශාල ශිරා සාදමින් අවසානයේ යාකෘතික ශිරාව සාදයි.
  - ✓ කෝටරාභවල ආස්තරණයේ යාකෘතික මහාභක්ෂණු (Kupffer cell) පවතී. මෙම සෛල භක්ෂක කෘත්‍යයක් ඉටු කරයි.




**අක්මාවේ පටක විද්‍යාත්මක ව්‍යූහය**

<u>ජීරණයට අදාළව අක්මාවේ කෘත්‍යය</u>

1. අක්මාව පිත ස්‍රාවය කරන අතර, ඒවා ග්‍රහනියට නිදහස් කරන තුරු පිත්තාශයේ ගබඩා කර තැබේ.
2. පිතෙහි පිත්ත ලවණ ඇති අතර, ඒවා තෛලෝදකාරක ලෙස ක්‍රියා කරන අතර, එමඟින් මේද ජීරණයට හා අවශෝෂණයට උදවු වේ.
3. බොහෝ අවශෝෂණය කරන ලද පෝෂක අක්මාවට ළඟා වන අතර, අක්මාව එම පෝෂක දේහයේ අනෙකුත් ප්‍රදේශවලට බෙදා හැරීම යාමනය කරයි.
4. අතිරික්ත ග්ලූකෝස් ග්ලයිකෝජන් ලෙස අක්මා සෛලවල ගබඩා කරයි.
5. ඉන්සියුලින් හා ග්ලූකගන් හෝමෝන මඟින් ග්ලයිකොජන් අක්මා සෛල තුළ තැන්පත් කිරීම හා බිඳ හෙළීම යාමනය කරයි.
6. මේදයේ ද්‍රාව්‍ය විටමින් (A,D,E සහ K) සහ සමහර ජල ද්‍රාවී විටමින් (විටමින් $B_{12}$), යකඩ (Fe) සහ කොපර් (Cu) ද අක්මාව තුළ ගබඩා කෙරේ.

**<u>ආහාර ජීරණ කාර්යභාරයට අමතරව අක්මාවේ කෘත්‍යයන්</u>**

1. ……………………………………………………………………………………
2. ……………………………………………………………………………………
3. ……………………………………………………………………………………
4. ……………………………………………………………………………………
5. ……………………………………………………………………………………

## <u>මිනිසා තුළ ජීර්ණයේ යාමනය</u>

- ජීරණය ආකාර දෙකකින් යාමනය වේ.

    1. ………………………………………………………………
    2. ………………………………………………………………

### <u>1. ස්නායුක යාමනය</u>

- ස්නායුක යාමනය ප්‍රධාන වශයෙන් ස්නායුක ප්‍රතික මඟින් සිදු වේ.
- උදාහරණ ලෙස ස්නායුක ප්‍රතික මඟින් ආහාරය මුඛයට ළඟා වූ විට දී ඛේටය නිදහස් කිරීම උත්තේජනය කරයි.

### <u>2. අස්නායුක යාමනය</u>

- ආහාර ආමාශයට ළඟා වීම මඟින් මත්ගෑමේ ක්‍රියාවලිය හා ආමාශයික යුෂ නිදහස් වීම වේ. අන්තරාසර්ග පද්ධතිය ජීරණයේ දී විශේෂයෙන් ම ආමාශයේ දී හා කුඩා අන්ත්‍රයේ දී සිදුවන ජීරණය තුළ ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරයි. ආමාශයට ආහාර ළඟා වීමේ දී ආමාශ බිත්තිය ඇදෙයි. මේ හේතුවෙන් ක්‍රියාරම්භ වී ගැස්ට්‍රින් හෝමෝනය නිදහස් වේ. ගැස්ට්‍රින් රුධිරය හරහා සංසරණය වී ආමාශයට ළඟා වේ. ආමාශය තුළ දී ආමාශයික යුෂ නිපදවීම ගැස්ට්‍රින් මඟින් උත්තේජනය වේ.
- ආමලසයේ ඇති මේද අම්ල හා ඇමයිනෝ අම්ල ග්‍රහනියෙන් කොලිසිස්ටොකයිනින් හා සික්‍රිටින් නිදහස් කිරීම ක්‍රියාරම්භ කරයි. කොලිසිස්ටොකයිනින් මඟින් පිත්තාශයෙන් පිත නිදහස් කිරීම සහ අග්න්‍යාසයෙන් ජීරණ එන්සයිම නිදහස් කිරීමත් කරයි. අග්න්‍යාසයෙන් බයිකාබනේට නිදහස් කිරීම සික්‍රිටින් මඟින් උත්තේජනය වේ. ආමාශයෙන් ලැබෙන, ආමලසය බයිකාබනේට මඟින් උදාසීන කරයි.
- ආමලසය මේද මඟින් පොහොසත් වූ විට, ග්‍රහනියෙන් නිපදවන කොලිසිස්ටොකයිනින් සහ සික්‍රටින් ඉහළ මට්ටමට හේතුවෙන් ආමාශයේ දී ආහාර ජීරණය සෙමෙන් සිදු වේ. මේ හෝමෝන ආමාශය මත ක්‍රියා කර, ක්‍රමාකුංචනය හා ආමාශයික යුෂ ස්‍රාවය නිෂේධනය කරයි.